බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාශයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මාකොළ දකුණේ තිබෙන තුත්තිරිහේන නමැති ඉඩමෙන් බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටසට ලෙස්ලි එම්. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන මැන සකස් කරන ලද පිඹුරු අංක 817 සහ 2001.02.03 දින දරන පිඹුර ප්‍රකාර, උතුරු-නැගෙනහිරට : විද්‍යාල මාවතට සම්බන්ධ වන අඩි 10ක් පළල පාර ද, දකුණු-නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණු-බස්නාහිරට : එච්. පී. ඊ. පෙරේරා බලයලත් මිනින්දෝරු තැනගේ අංක 5123 පිඹුරේ ලොට් ඒ ද සහ උතුරු-බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටසට යන මායිම් තුළ පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20) ක් විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ ඇති ගහකොල, පළතුරු ආදී සියළු දේද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 490/223 වශයෙන් ලියාපදිංචි වී ඇත.

එකී මාකොළ දකුණේ තිබෙන තුත්තිරිහේන නමැති ඉඩමේ පාරක් සඳහා බෙදා වෙන් කළ ලොට් 01 දරන ඉඩම් කොටසට ලෙස්ලි එම්. ප්‍රනාන්දු බලයලත් මිනින්දෝරු තැන මැන සකස් කරන ලද පිඹුරු අංක 748 දරන පිඹුරු ප්‍රකාර උතුරු-නැගෙනහිරට : අංක 4130 දරන පිඹුරේ ලොට් බී1 ද, දකුණු-නැගෙනහිරට : ලොට් 2 සහ 3 ද, දකුණ-බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස ද සහ උතුරු-බස්නාහිරට : විද්‍යාල මාවත ද යන මායිම් තුළ පර්චස් දාහතක් (අ. 0, රූ. 0, පර්. 17) ක් විශාල බිම් ප්‍රමාණය සහ ඒ තුළ ඇති ගහකොළ, පළතුරු ආදී සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 490/219 වශයෙන් ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
(බටහිර කලාපය 01).

මහජන බැංකුව,
කලාපීය ප්‍රධාන කාර්යාලය,
(බටහිර කලාපය 01),
අංක 11, ආදිපදී වීදිය,
කොළඹ 01.

10-853

## සෙලාන් බැංකුව පීඑල්සී-වරකාපොල ශාඛාව
## 2007 අංක 07 දරන සමාගම් පනත අනුව-යොමුව ජීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0700-07161320-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 අගෝස්තු මස 17 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන්ම සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක ජීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් ඊ. ඩී. එම්. ජයවර්ධන විසින් දෙකම සහතික කරන ලද 1995 ජනවාරි මස 06 දිනැති අංක 7507 සහ 1995 ජූලි 17 දිනැති අංක 7711, ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. ජී. අයි. ගම්ලත් විසින් දෙකම සහතික කරන ලද 1999 ජූලි මස 08 දිනැති අංක 326 සහ 2000 ජනවාරි මස 25 දිනැති අංක 399 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, වරකාපොල වසන්ත ටයර් සර්විස් හි අධිපති වන අතුලවංශ දොන් සිසිර කුමාර රණසිංහ යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් දහහතරලක්ෂ එකොලොස්දහස් නවසිය හැටඅටයි ශත විසි එකක (රු. 14,11,968.21) මුදලක්, 2006 පෙබරවාරි මස 28 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතු සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 14,11,968.21 මුදල ද, 2006 මාර්තු මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 7507, 7711, 326 සහ 399 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ඉඩම් ලියාපිදංචි කිරීමේ කොට්ඨාශය තුළ හාපිටිගම් කෝරළේ, උඩුගහපත්තුතවේ, බෝතලේ ඉහලගම පිහිටි බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද 1991.09.21 දිනැති අංක 5175 දරන සැලැස්මේ සඳහන් බැබිලපිටිය වත්ත නැමැති ඉඩමේ කැබලි අංක 5බී ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි බැබිලපිටිය වත්ත කැබලි අංක 5හි කොටසක් ද, නැගෙනහිරට : සංවර්ධන සභා පාර, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට හිමි බැබිලපිටිය වත්ත, දකුණට සහ බස්නාහිරට : සංවර්ධන සභා පාර ද යන මායිම් තුළ අක්කර හයයි, රූඩ් තුනයි, පර්චස් තිස් අටක් (අ. 6, රූ. 3, පර්. 38)ක් විශාල ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්ඉරුව එප් 220/273 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-841/4

## සෙලාන් බැංකුව පීඑල්සී-මරදාන ශාඛාව

2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 ජූලි මස 18 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගිණුම් අංකය : 0470-486437-001.

"සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිවු 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඊ. එස්. පීරිස් විසින් සහතික කරන ලද 1997 අගෝස්තු මස 27 දිනැති අංක 64 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. පී. එල්. එච්. එච්. සිල්වා විසින් සහතික කරන ලද 1998 අප්‍රේල් මස 9 දිනැති අංක 948 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කොළඹ 13හි යෙමා එක්ස්පෝර්ට් ඇන්ඩ් ට්‍රේඩ් යන නාමය, විලාශය සහ අභිධානය යටතේ හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යන තවමනි යේසයියා, අන්නමරි යේසයියා, කිංස්ලි යේසයියා, අප්පුතුරෙයි මහලිංගම් සහ මංගයාට්කරසි මහලිංගම් යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් පනස් හයලක්ෂ අසූ එක්දහස් තුන්සිය හැටතුනයි ශත අනූ නවයක් (රු. 56,81,363.99) මුදලක්, 2006 සැප්තැම්බර් මස 30 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 56,81,363.99 මුදල ද, 2006 ඔක්තෝබර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 64 සහ 948 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර ඩන්ස්ටන් කෙලාර්ට් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අඑත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, හැඳල මටගොඩ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1996 නොවැම්බර් මස 1 දිනැති අංක 112 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැකුණගහ කුරුඳුවත්ත නමැති දැන් බලගල පාර වරිපනම් අංක 100/10 දරන ලොට් ඒ ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1986 මැයි 18 දිනැති අංක 2453 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කැබලි අංක 2හි නැවත මැනීමක් වන) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : බල පාර වත්තල වරිපනම් අංක 100/3 දරන පරිශ්‍රය ද, නැගෙනහිරට : අගල ද, දකුණට : බලගල පාර වරිපනම් අංක 100/11 දරන පරිශ්‍රය සහ බස්නාහිරට : අඩි 10ක් පළල ප්‍රවේශ මාර්ගය ද යන මායිම් තුළ එකී අංක 112 දරන සැලැස්ම අනුව පර්චස් නවයයි දශම නවයයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 9.90) විශාල බිම, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය කොළඹ දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය පත්ඉරුව බී 1579/276හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම තුළ උඩින්, යටින් සහ දිගේ මාර්ග අයිතිය සමග.

පෙර කී හැඳල මටගොඩ පිහිටි කැකුණගහ කුරුඳුවත්ත නමැති ඉහත කී ඉඩමේ ලොට් බී1හි බෙදූ කොටසක් වන පෙර කී අංක 2453 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 6 ලකුණු කළ (පාරක් සඳහා වෙන් කිරීම) ඉඩම් කොටසට මායිම්, උතුරට : කැබැලි අංක 5 සහ 4 ද, නැගෙනහිරට : කැබැලි අංක 3 සහ 2 ද, දකුණට : අංක 42 දරන සැලැස්මේ සඳහන් ලොට් බී2 සහ ලොට්1 සහ බස්නාහිරට : අංක 43 දරන සැලැස්මේ සඳහන් ඒ කැබැල්ල (අඩි 10ක් පළල පාර) සහ බලයලත් මිනින්දෝරු පී. අතුරලිය විසින් සාදන ලද 1946 ඔක්තෝබර් මස 19 දිනැති අංක 43 දරන සැලැස්මේ සඳහන් ලොට් බී2 ද යන මායිම් තුළ එකී අංක 2453 දරන සැලැස්ම අනුව පර්චස් එකොලහක් (අ. 0, රූ. 0, පර්. 11) විශාල ඉඩම. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් බී 1812/32 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-841/3

---

## සීමාසහිත සෙලාන් බැංකුව-පානදුර ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය : 0050-689150-001.

සීමාසහිත සෙලාන් බැංකුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 මාර්තු මස 05 වැනි දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන්ම සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"සීමාසහිත සෙලාන් බැංකුව නමට ලියන ලද ප්‍රසිද්ධ නොතාරිස් තිලිනි පී. කරුණාසේකර විසින් සහතික කරන ලද 2002 ජූලි මස 16 දිනැති අංක 681 දරන බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, පානදුරහි මෙසස් එස්. ඩී. මාකටිං සර්විසස් (ඩබ්ලිව්/සීසී/1953) යන නාමය, විලාශය සහ අභිධානය යටතේ ස්වාමිත්වයේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පානදුර වරුසහෙන්නදිගේ සුනිල් දීපචන්ද්‍ර ප්‍රනාන්දු යන අය බන්ධනදායී වශයෙන් රුපියල් දහහත් ලක්ෂ අසූදෙදහස් පන්සිය හයයි ශත විසිනවයක (රු. 17,82,506.29) මුදලක්, 2006 පෙබරවාරි මස 6 වැනි දින වන විට සීමාසහිත සෙලාන් බැංකුවට ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද, එකී රු. 17,82,506.29 මුදල ද, 2006 පෙබරවාරි මස 07 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 681 දරන බැඳුම්කර මගින් සීමාසහිත සෙලාන් බැංකුව වෙත උකස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර

ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ, පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභාවේ පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 1998.04.06 දිනැති අංක 428 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දොඹගහවත්ත කැබලි අංක ඒ නමැති ඉඩමේ කැබලි අංක ඒ1 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් උතුරට : දොඹගහවත්තේ කොටසක් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : මෙම ඉඩමේ ඩී කැබැල්ල (අංක 1140 දරන සැලැස්මේ සඳහන් පාර සඳහා වෙන් කිරීම) ද සහ බස්නාහිරට : අංක 428 දරන සැලැස්මේ සඳහන් ඒ2 කැබැල්ල ද යන මායිම් තුළ එකී අංක 428 දරන සැලැස්ම අනුව පර්චස් දහහතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 17.50) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 340/275, එප් 360/254හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඒ1 දරන ඉඩම් කැබැල්ල පහත විස්තර කරනු ලබන ඉඩමෙන් කොටසකි :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභාවේ පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල් ද සිල්වා විසින් සාදන ලද 1976.02.15 දිනැති අංක 1140 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දොඹගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක ඒ ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : දොඹගහවත්තේ කොටසක් ද, නැගෙනහිරට : පාර ද, දකුණට : දොඹගහවත්තේ ඩී කැබැල්ල ද සහ බස්නාහිරට : අංක 1140 දරන සැලැස්මේ සඳහන් බී කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 22.5) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 340/214හි ලියාපදිංචි කර ඇත.

පහත සඳහන් ඉඩම් තුළ උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ අනිකුත් අදාළ පොදු අයිතීන් සමග :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්ද පානදුර ප්‍රාදේශීය සභාවේ පානදුර නගර සභා සීමාව තුළ පට්ටිය දකුණ පිහිටි බලයලත් මිනින්දෝරු එල්. ඩබ්ලිව්. එල්. ද සිල්වා විසින් සාදන ලද 1976.02.15 දිනැති අංක 1140 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දොඹගහවත්ත නමැති ගොඩනැගිලි, ගස්, වගා, බිම සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩමේ කැබලි අංක ඩී ලකුණු කළ (අඩි 8ක් පළල පාර සඳහා වෙන් කිරීම) බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්, උතුරට : මෙම ඉඩමේ ඒ සහ බී කැබැලි ද, නැගෙනහිරට : පාර ද, දකුණට : දොඹගහවත්තේ කොටසක් සහ බස්නාහිරට : මෙම ඉඩමේ සී කැබැල්ල ද යන මායිම් තුළ පර්චස් පහයි දශම අටක් (අ. 0, රූ. 0, පර්. 5.8) විශාල ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍රිරුව එප් 273/17හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-841/1

සෙලාන් බැංකුව පීඑල්සී-මරදගහමුල ශාඛාව
2007 අංක 7 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරණ ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007 සැප්තැම්බර් මස 20 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේ දී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

ගිණුම් අංකය : 0840-09553850-001

"සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 9 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් එස්. සී. රණවීර විසින් සහතික කරන ලද 1998./02./16 දිනැති අංක 3214 සහ 1999.07.12 දිනැති අංක 3730 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, දූනගහ හි සිරිපාල සෙනරත් යාපා යන අය බන්ධනදායී වශයෙන් පැහැර හැර ඇතිහෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් තුන් ලක්ෂ තිස් දෙදහස් නවසිය හැත්තෑ අටයි ශත දහතුනක (රු. 3,32,978.13) මුදලක්, 2005 නොවැම්බර් 30 වෙනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 3,32,978.13 මුදල ද, 2005 දෙසැම්බර් 1 දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට, එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තුද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 3214 සහ 3730 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උගස් කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපල සහ පරිශ්‍රය බලයලත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.".

උපලේඛනය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ දූනගහ පත්තුවේ අළුත්කුරු කෝරළේ දිවුලපිටිය ප්‍රාදේශීය සභා සහ උපකාර්යාල සීමාව තුළ කඩවල, මඩම්පැල්ල සහ කෝන්ගොඩමුල්ල යන ගම්වල පිහිටි බලයලත් මිනින්දෝරු එස්. ඩී. චන්ද්‍රතිලක විසින් සාදන ලද 1990.04.23 දිනැති අංක 526 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන කුඩුම්රිසපින්නලන්ද, කහටගහවත්ත, දෙල්ගහවත්ත හෙවත් කොස්ගහවත්ත නමැති ඉඩමේ කැබැලි අංක 128 ලකුණු කළ බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම්: උතුරට: කැබැලි අංක 127බී, 126ඒ සහ 126බී ද, නැගෙණහිරට කැබැලි අංක 130 හි රජයේ ඉඩම ද, දකුණට: කැබැලි අංක 129 සහ බස්නාහිරට: කැබැලි අංක 162 (අඩි 20 ක් පළල පාර සඳහා වෙන් කිරීම) ද, යන මායිම් තුළ එකී අංක 526 දරන සැලැස්ම අනුව පර්චස් විසි නවයයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 29.20) විශාල, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය / පත්‍රිරුව ඊ 723 /154 යටතේ ලියාපදිංචි කර ඇත.

අවම මිල රු. 5,25,000කට නියම කළ යුතු බවට මෙයින් සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ කරන අවස්ථාවේ දී ඉහත සඳහන් අධ්‍යක්ෂ මණ්ඩල සම්මුතිය අත්සන් කිරීමට සෙලාන් බැංකුව පීඑල්සී හි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සමානාධිකාරී - නීති, චන්ද්‍රසිරි කොටිගල මහතාට බලය පැවරිය යුතු බවට වැඩිදුරටත් සම්මත කර ගන්නා ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී. කොටිගල,
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී-නීති.

10-841/2

---

## මහජන බැංකුව - තංගල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් සහතික කරන ලද 2005.05.26 දිනැති අංක 1256 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, වසන්ත පද්මසිරි ලියනගේ ද සිල්වා යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂ පනස් පන්දහස් දෙසිය දහනමයයි ශත දහනමයක (රු. 4,55,219.19) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද 2006.12.01 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් හාරලක්ෂ පනස් පන්දහස් දෙසිය දහනමයයි ශත දහනමයයි (රු. 4,55,219.19) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුවී එකී රුපියල් හාරලක්ෂ පනස් පන්දහස් දෙසිය දහනමයයි ශත දහනමයක (රු. 4,55,219.19) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 1256 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මෙයින් තීරණය කරයි.".

### උකස් කර ඇති දේපල විස්තර

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල නගර සභා සීමාවේ, මාතර පාර, අංක 71හි පිහිටි පල්ලියවත්ත හෙවත් ඇන්නපිටිය කන්ඩිය බොඩවත්ත නමැති ඉඩමේ 1ඒ කැබැල්ලට බලයලත් මිනින්දෝරු ජී. වර්ණකුලසූරිය මහතා විසින් මැන 1990.11.02 දින සම්පාදිත අංක 1175 දරන පිඹුර ප්‍රකාර කැබැල්ලට මායිම් උතුරට : මාතර පාරේ වරිපනම් අංක 69 ද, නැගෙනහිරට : මාතර පාරේ වරිපනම් අංක 1/75 ද, දකුණට : මෙම ඉඩමේම ලොට් 1බී ද, බටහිරට : පාර ද යන සතර මායිම් තුල පිහිටි පර්චස් එකයි දශම අටයි හතයි පහක් (පර්චස් 1.875) විශාල ඉඩම සහ එය තුල පිහිටි වැව්ලි, ගොඩනැගිලි යනාදී සියළු දෙය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ, ටවර්හිල් මාවත,
හම්බන්තොට.

10-857

---

## මහජන බැංකුව - තංගල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් 2007.07.27 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

"තංගල්ල ප්‍රසිද්ධ නොතාරිස් බී. එම්. ඩී. කුමුදිනී මිය විසින් සහතික කරන ලද 2005.08.25 දිනැති අංක 1393 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, කුමාරප්පෙරුම ආරච්චිගේ හේමචන්ද්‍ර යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් අටලක්ෂ අසූදහස් පන්සිය අසූ තුනයි ශත දොළහක (රු. 8,80,583.12) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද 2007.01.27 දින සිට වර්ෂයකට 19.5% බැගින් රුපියල් අටලක්ෂ අසූදහස් පන්සිය අසූතුනයි ශත දොළහක (රු. 8,80,583.12) මුදල සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය සහ අදාල මහජන බැංකු පනතේ 29එල් වගන්තියයටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුවී එකී රුපියල් අටලක්ෂ අසූදහස් පන්සිය අසූ තුනයි ශත දොළහක (රු. 8,80,583.12) මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් ඉහත කී අංක 1393 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපල සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපල විස්තර

01. දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ රන්නේ පිහිටි ලෝලු ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ආර්. මාහරණ මහත්මිය විසින් 2001.06.12 වන දින සකස් කරන ලද අංක 387 දරන පිඹුරේ අංක 06 දරන කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්, උතුරට : අංක 387 දරන පිඹුරේ අංක 05 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 387 දරන පිඹුරේ අංක 07 දරන කැබැල්ල ද, දකුණට : අංක 387 දරන පිඹුරේ අංක 09 දරන කැබැල්ල ද, බස්නාහිරට : තංගල්ල සිට අගුණකොළපැළැස්ස දක්වා වූ මහා මාර්ගය ද යන සතර මායිම් තුල පිහිටි රූඩ් එකයි පර්චස් දෙකයි දශම තුනක් විශාල (අක්කර 0, රූඩ් 01, පර්චස් 2.3) විශාල ඉඩම සහ එය තුළ පිහිටි වැව්ලි ගොඩනැගිලි යනාදී සෑම සියළු දෙය ද වේ.

02. දකුණු පළාතේ,හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවා පත්තුවේ, තංගල්ල නගර සහා සීමාව තුළ දංකැටියේ පිහිටි විරගහවත්ත නැමති ඉඩම බලයලත් මිනින්දෝරු ඩී. සී. විජේන්ද්‍ර මහතා විසින් මැන 1960.04.15 වැනි දින සම්පාදිත අංක 1160 දරන පිඹුරේ බෙදා වෙන්කළ A අක්ෂරය දරන පිඹුර, නැවතත් බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා මහතා විසින් 1992.09.04 වැනි දින සම්පාදිත අංක 2060A දරන පිඹුරේ A2 ලෙස දක්වා ඇති ඉඩමට කේ. ආර්. මාහරණ මිය විසින් සම්පාදිත 96/2005 හා 2005.08.18 දිනැති පිඹුරේ බෙදා වෙන් කළ අංක 01 දරන කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්. උතුරට : අංක 2060A දරන පිඹුරේ A01 දරන කැබැල්ල ද, නැගෙනහිරට : තංගල්ල සිට හම්බන්තොට දක්වා වූ මහා මාර්ගය ද, දකුණට : අංක 2060A දරන පිඹුරේ A 03 දරන කැබැල්ල ද, බස්නාහිරට : හම්බන්තොට පාරේ වරිපනම් අංක 105/6 දරන අංක 194 දරන පිඹුරේ අංක 24 දරන කැබැල්ල *හෙවත්*, රත්මල්ගහවත්ත *හෙවත්* කරගහවත්ත *හෙවත්* මැදකොරටුව සහ කුකුන්දවල ද,

යන සතර මායිම් වල පිහිටි පර්චස් දෙකයි දශම අටක් (අක්. 0, රූඩ් 0, පර්චස් 2.8) විශාල තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක F154/202 දරන පත්ඉරුවේ ලියාපදිංචි වී ඇති ඉඩම හා ඒ තුළ පිහිටි වැවිලි ගොඩනැගිලි යනාදී සැම සියළු දෙය ද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හම්බන්තොට.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 7ඒ,
ටවර්හිල් මාවත,
හම්බන්තොට.

10-858

---

## සී/සහිත හැටන් නැපනල් බැංකුව-රත්නපුර ශාඛාව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007 ජූලි මස 31 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. වාලුපිල්ලෙයි විසින් සහතික කරන ලද්දා ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද, 1992.09.17 සහ 1995.03.29 දිනැති පිළිවෙලින් අංක 3564 සහ 3777 දරන බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජිනදාස ගුරුගේ යන අය ණයකරු හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරයන් යටතේ රුපියල් විසිහතර ලක්ෂ අසූනව දහස් අටසිය හැත්තෑ දෙකයි ශත අනූ තුන (රු. 2,489,872.93) මුදලක් 2007.05.31 දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 2,489,872.93 ක මුදලට 2007.06.01 වන දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළියද ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩුකොට එකී අංක 3564 සහ 3777 දරන උකස් බැඳුම්කරයන් මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තාවූ ද දේපල හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු එන්. එච්. පී. එෆ්. ආරියරත්න මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සී/සහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනි.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩ පත්තුවේ, රත්නපුර නගරයේ උප දිසාපති සහ ග්‍රාම සේවක කොට්ඨාසයේ රත්නපුර මහනගර සභා සීමාවේ, කොටුව වසමේ රත්නපුර නගරයේ සේව්යා මාවතේ, "රත්න නිවස" නමින් හඳුන්වන වරිපනම් අංක 30 (කලින් අංක 10) දරන ඉඩමට බලයලත් මානක එම්. ඩබ්. රත්නායක විසින් මැන සාදන ලද 1988 ඔක්තෝබර් 15 වන දිනැති අංක 2650 දරන පිඹුරේ ලොට් අංක 01 දරන ඉඩම් කොටස උතුරට ෆ්‍රෑන්ක් හෙට්ටිආරච්චි මාවත, සහ සේව්යා මාවතේ, අංක 26 දරන පරිශ්‍රයෙන්ද, නැගෙනහිරට සේව්යා මාවතේ, අංක 26 දරන පරිශ්‍රයෙන්ද, දකුණට සේව්යා මාවතේ, අංක 32 ඒ දරන පරිශ්‍රයෙන් ද, සහ බටහිරට රජයේ ඉඩමෙන්ද මායිම් වූ පර්චස් තිස් පහයි දශම තුනයි හතයි පහ (අ. 0, රූ. 0, පර්. 35.375) විශාලත්වය ඇති ඉඩම සහ ඊට අයත් ගොඩනැගිලි ද සමග රත්නපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ඒ 620/238 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණි (නීති),
මණ්ඩලයේ ලේකම්.

10-865

---

එන්(පීවීඑස්)5140.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "රක්වාන ඩෙයරි fපාර්මර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1989.01.23 දින සංස්ථාපිත සමාගමක් වන රක්වාන ඩෙයරි fපාර්මර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, රක්වාන ඩෙයරි fපාර්මර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින

බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්.

2007 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10-877

---

එන්(පීවීඑස්)35117.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "ඉකෝ-කෙයාර් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2003.09.19 දින සංස්ථාපිත සමාගමක් වන ඉකෝ-කෙයාර් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, ඉකෝ-කෙයාර් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්.

2007 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10-878

---

එන්(පීවීඑස්)4876.

## 2007 අංක 07 දරන සමාගම් පනත

### 394(3) වගන්තිය යටතේ "කිරිපැක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 1988.09.23 දින සංස්ථාපිත සමාගමක් වන කිරිපැක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව *නැතහොත්* ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, කිරිපැක් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුව හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394 (3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජෙනරාල්.

2007 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ 10, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

10-879

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.